# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,934 — 1970 නොවැම්බර් 27 වැනි සිකුරාද — 1970.11.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... — — | 158 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් — — — | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... — — | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් .. | 157 | නොතාරිස් ලැයිස්තුව — — — | — |
| වස්තු භාගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් — — — | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — | | |



## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

### මහෙස්ත්‍රාත් උසාවිය, ගම්පොල

**වටිනාකමක් නැති ලේඛන විනාශ කිරීම**

1938 වර්ෂයේ, ගම්පොල මහෙස්ත්‍රාත් උසාවියේ පවරන ලද අංක 15,300 සිට 15,799 දක්වා වූ නඩු වාර්තා 500, මෙම දැන්වීමේ සඳහන් දිනේ සිට තුන් මසක් ඉකුත් වූ පසු වටිනාකමක් නැති ලේඛන විනාශ කිරීමේ ආඥාපනතේ විධිවිධාන අනුව විනාශ කරන බව මින් දැනුම්දෙනු ලැබේ.

යම්කිසි නඩු වාර්තාවක් පිළිබඳ සැළකිලිමත් වන කෙනෙකුට එබඳු නඩු වාර්තාවක් විනාශ නොකරන ලෙස පෞද්ගලිකව, නීතිඥ මහතෙකුගේ මගින් හෝ දිව්රුම් පෙත්සමක් මගින්ද සෑනෙන කරුණු ඉදිරිපත් කිරීමෙන් ඉල්ලා සිටිය හැක.

ඇල්. ඒ. ගුණවර්ධන,
ගම්පොල මහෙස්ත්‍රාත්.

1970.11.27 ද,
ගම්පොල මහෙස්ත්‍රාත් උසාවිය.

11-1092

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1970 ජුනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
**කොළඹ.**

**ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්.**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## කුරුණෑගල දිස්ත්‍රික් තඩුශාලාවේදීය

කුරක්කන්හේනේගෙදර පදිංචි දිවාකර මුදියන්සේලාගේ පොඩි මැණිකා ........................................................ පැමිණිලිකාරි.

නොම්මරය 1935/පී එදිරිව

(1) කුරක්කන්හේනේගෙදර දිවාකර මුදියන්සේලාගේ කුසුමාවතී ;
(2) පහල නුංගමුවේ පදිංචි දිවාකර මුදියන්සේලාගේ ලීලාවතී ;
(3) ඉබ්බාවල කොලනියේ අංක 45 දරන ස්ථානයේ පදිංචි දිවාකර මුදියන්සේලාගේ සෝමාවතී ..............................විත්තිකාරියෝ.

මෙහි පහත සඳහන් වෙන ලේඛණවලින් ඉහතකී තඩුවේ 1 වෙනි, 2 වෙනි සහ 3 වෙනි විත්තිකාරියන්ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1970 ක්වූ දෙසැම්බර් මස 24 දින පෙ. ව. 11 ට පටන්ගෙන එක් එක් ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

අයවිය යුතු මුදල : රුපියල් 172.60 ක් සහ පිස්කල් ගාස්තු පවුන්ඩේජ් ගාස්තු ආදිය අයකර ගැණීම පිණිස.

### උපලේඛනය

1. වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ මැද්දේකැටිය කෝරලේ කුරක්කන්හේනේගෙදර පිහිටි කදුරුගහ කුඹුරේවත්ත සහ කදුරුගහමුල කුඹුරේවෙල යන ඉඩම් වලින්—ඇස්. වී. ගුණසේකර බලයලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද අංක 2560 සහ 1966. 3. 11 දින දරන ප්ලෑනයේ ලොට් අංක 4 දරණ කොටසට මායිම් :—උතුරට : ඩී. ඩබ්ලිව්. ඇස්. විජේසිංහගේ වත්ත ; නැගෙනහිරට : ලොට් අංක 5 ; දකුණට : ලොට් 5 ; බස්නාහිරට : ලොට් 3 සහ ලොට් 13 යන මායිම් තුළ පර්චස් 15 1/15 ක් විශාල ඉඩම.

2. ඉහත කී කුරක්කන්හේනේගෙදර පිහිටි ඉහත සඳහන් ප්ලෑනයේ ලොට් අංක 8 දරන කොටසට මායිම් :—උතුරට : ඩී. ඇස්. ඩබ්ලිව්. විජේසිංයගේ වත්ත ; නැගෙනහිරට : ලොට් අංක 7 ; දකුණට : පැමිණිලිකාරියට සහ තවත් අයට අයිති කුඹුර ; බස්නාහිරට : ලොට් අංක 9 යන මායිම් තුළ පර්චස් 06, 2/5 ක් විශාල ඉඩම.

3. ඉහතකී කුරක්කන්හේනේගෙදර පිහිටි ඉහත සඳහන් ප්ලෑනයේ ලොට් අංක 3 දරණ කොටසට මායිම් :—උතුරට : ඩී. ඇස්. ඩබ්ලිව්. ඇස්. විජේසිංහගේ වත්ත ; නැගෙනහිරට : ලොට් අංක 4 ; දකුණට : ලොට් අංක 13 ; බස්නාහිරට : ලොට් අංක 2 යන මායිම් තුළ පර්චස් 15, 1/15 ක් විශාල ඉඩම.

4. ඉහත කී කුරක්කන්හේනේගෙදර පිහිටි ඉහත සඳහන් ප්ලෑනයේ ලොට් අංක 9 දරණ කොටසට මායිම් :—උතුරට : ඩී. ඩබ්ලිව්. ඇස්. විජේසිංහගේ වත්ත ; නැගෙනහිරට : ලොට් අංක 8 ; දකුණට : පැමිණිලිකාරියට සහ තවත් අයට අයිති කුඹුර ; බස්නාහිරට : ලොට් අංක 10 යන මායිම් තුළ පර්චස් 06, 2/5 ක් විශාල ඉඩම.

5. ඉහත කී කුරක්කන්හේනේගෙදර පිහිටි ඉහත සඳහන් ප්ලෑනයේ ලොට් අංක 11 දරන කොටසට මායිම් :—උතුරට : ඩී. ඩබ්ලිව්. ඇස්. විජේසිංහගේ වත්ත ; නැගෙනහිරට : ලොට් අංක 10 ; දකුණට : පැමිණිලිකාරියට සහ තවත් අයට අයිති කුඹුර ; බස්නාහිරට : ලොට් අංක 12 යන මායිම් තුළ පර්චස් 06 7/15 ක් විශාල ඉඩම.

6. ඉහත කී කුරක්කන්හේනේගෙදර පිහිටි ඉහත සඳහන් ප්ලෑනයේ ලොට් අංක 12 ට මායිම් :—උතුරට : ජේ. ඒ. බුම්පි අප්පුහාමි සහ තවත් අයගේවත්ත ; නැගෙනහිරට : ලොට් අංක 11 ; දකුණට : පැමිණිලිකාරියට සහ තවත් අයට අයිති කුඹුර ; බස්නාහිරට : ජේ. ඒ. බුම්පි අප්පුහාමි සහ තවත් අයට අයිති වත්ත යන මායිම් තුළ පර්චස් 6, 2/5 ක් විශාල ඉඩම.

ඩබ්ලිව්. ඩබ්ලිව්. වැත්තෑව,
වයඹ පලාතේ පිස්කල් වෙනුවට.

වර්ෂ 1970 ක්වූ නොවැම්බර් මස 8 වැනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේ දීය.

11-793

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට නැඹෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.